රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 04/2016

මගේ අංක : EST-1/CIRL/03/0001
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2016.12.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## තෑගි බෝග හා ආධාර ලැයිස්තු

ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVII පරිච්ඡේදයේ 3 උප වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී වගන්තියේ විධිවිධාන පරිදි රජයේ නිලධරයකු විසින් කිසිම තුටු පඬුරක්, තෑගි බෝග ආදියක් හෝ වෙනත් ලාභ ප්‍රයෝජනාදියක් කෙළින්ම හෝ අන් කෙනෙකුගේ මාර්ගයෙන් හෝ භාර ගැනීම ආයතන සංග්‍රහයේ පළමුවන උපලේඛනය යටතට ගැනෙන වරදක් වන අතර අල්ලස් පනතේ 19 (ඇ) වගන්තිය යටතේ වසර 07 ක සිර දඬුවමකින් සහ රුපියල් පන්දහස දක්වා දඩයකින් දඬුවම් ලැබිය හැකි අපරාධමය වරදක් ලෙස ද දක්වා ඇත.

03. උත්සව සමයන්හි දී පෞද්ගලික සමාගම් විසින් රජයේ නිලධරයන්ට ත්‍යාග පාර්සල්, ත්‍යාග වවුචර්, ගුවන් ටිකට්පත්, පෙර ගෙවීම් සහිත හෝටල්වල නවාතැන් පහසුකම් ආදී ත්‍යාග යැවීමට ඉඩකඩ පවතී. එබැවින් එවැනි ත්‍යාග භාර ගැනීමෙන් වළකින ලෙසට ඔබ ආයතනයේ සියලු ම නිලධරයන් දැනුම්වත් කරන ලෙස මෙයින් අවධාරණය කරමි.

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය